# ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
## ලංකා ධීවර සංස්ථාව
## පුරප්පාඩු

**ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සේවා ගණය : කණිෂ්ඨ කළමනාකාර**

**තනතුර : පරිපාලන නිලධාරි ( මානව සම්පත් හා පරිපාලන) (JM 1-1) - 01**

**සුදුසුකම්**
**බාහිර අපේක්ෂකයින්**

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය/මානව සම්පත් කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

01. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.
02. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන (MA 1-2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ මානව සම්පත් සංවර්ධන/පරිපාලන කටයුතු පිළිබඳ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප : **JM 1-1- 2025 Rs. [72650– 10x1360– 18 x2040-122,970]**
**රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා (ජීවන වියදම් දීමනාව) හිමි වේ.**

**වෙනත් ප්‍රතිලාභ :**

1. සේවක අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩුකර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මගින් 15% දායක මුදලක් බැර කරනු ලැබේ.
2. සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3%ක ප්‍රදානයන් බැර කරනු ලැබේ.

**පොදු කොන්දේසි**

(අ) අපේක්ෂකයින්ගේ වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අයවිය යුතු වේ.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාවක් අදාල නොවේ.

(ආ) රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ඈ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ සහතික පත්‍ද සමඟ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව 2026.10.12 දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(E mail : chairman@cfc.gov.lk )

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො 15, රොක් හවුස් පටුමග
කොළඹ 15.
දුරකථන අංක 0112-540455

SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED